# ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ මහා සභාව

# Sri Lanka Council of Archaeologists

## 1992 අංක 4 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කර ඇත

## Incorporated Under Act No 4 of 1992

SLCA

2022/2023 වර්ෂයට අදාළ 2023 මාර්තු මස 24 වන දින ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැති ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ මහාසභා රැස්වීමේ වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ 07.

Department of Archaeology, Colombo 07.

**2023 වර්ෂයේ දී පැවැති මහසභා රැස්වීම සඳහා පැමිණීමේ නාම ලේඛනය**

2023.03.24 දින පැවති මහ සභා රැස්වීමේ පැමිණීම

**<u>අධි සාමාජික</u>**

1. පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්.බෝහිංගමුව
2. පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී.මණ්ඩාවල
3. පුරාවිද්‍යාඥ ඇලෙක්සැන්ඩර් කපුකොටුව
4. පුරාවිද්‍යාඥ ඩී.එම්.එස්.ආර්. ප්‍රියංගා
5. පුරාවිද්‍යාඥ ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ
6. පුරාවිද්‍යාඥ වාසනා ප්‍රේමචන්ද්‍ර
7. පුරාවිද්‍යාඥ මහාචාර්ය එච්.එම්.වයි.වී.කේ.හේරත්
8. පුරාවිද්‍යාඥ ඩී.ඒ.සී.දඹදෙණිආරච්චි
9. පුරාවිද්‍යාඥ මහාචාර්ය ජ්.එම්.ගාමිණි අදිකාරි
10. පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න
11. පුරාවිද්‍යාඥ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි
12. පුරාවිද්‍යාඥ රාජ් බණ්ඩාර
13. පුරාවිද්‍යාඥ මහාචාර්ය ගාමිණි රණසිංහ
14. පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සොලංගආරච්චි

**<u>සාමාජික</u>**

01. පුරාවිද්‍යාඥ ආර්.එම්.බී.ටී.ඒ.බී. වන්නිනායක
02. පුරාවිද්‍යාඥ කේ.කේ.ඩී.සී.රණවීර
03. පුරාවිද්‍යාඥ එම්.වී.ජී.කේ.අසංග
04. පුරාවිද්‍යාඥ බී.එම්.ඩබ්.වයි.එම්.එම්.ජයසුන්දර
05. පුරාවිද්‍යාඥ ඒ.එම්.එස්.පාලිත අත්තනායක
06. පුරාවිද්‍යාඥ එම්.ඩී.අයි.කේ.අබේනායක
07. පුරාවිද්‍යාඥ කේ.ජී.මහින්ද කරුණාරත්න
08. පුරාවිද්‍යාඥ කේ.බී.ඒ.කේ.කාරියවසම්
09. පුරාවිද්‍යාඥ ලක්මාලි මාරසිංහ
10. පුරාවිද්‍යාඥ කේ.පී.කේ.බී.ජී.ගුණරත්න
12. පුරාවිද්‍යාඥ පී.එම්.ආර්.ප්‍රියදර්ශනී
13. පුරාවිද්‍යාඥ ඩී.ටී.ඒ.දයානන්ද
14. පුරාවිද්‍යාඥ ඩී.එම්.අයි.එන්.දනන්සූරිය
15. පුරාවිද්‍යාඥ අයි.පී.පී.ගුණසේන
16. පුරාවිද්‍යාඥ එන්.එම්.පරණගමගේ
17. පුරාවිද්‍යාඥ පියුමි මධුෂානි ඇඹුල්දෙණිය
18. පුරාවිද්‍යාඥ කේ.ජී.ඩී.ආර්.ධර්මවර්ධන
19. පුරාවිද්‍යාඥ එස්.ඒ.එන්.ප්‍රියදර්ශනී
20. පුරාවිද්‍යාඥ ඩබ්.පී.වල්පොල
21. පුරාවිද්‍යාඥ ඩී.එම්.අයි.එස්.කේ.දිසානායක
22. පුරාවිද්‍යාඥ ජී.ජී.යූ.එච්.ගොඩගෙදර
23. පුරාවිද්‍යාඥ එච්.ඒ.කේ.එන්.කේ.ආරියරත්න
24. පුරාවිද්‍යාඥ පූජ්‍ය රත්නේ සීලවිමල හිමි
25. පුරාවිද්‍යාඥ පූජ්‍ය කැලෑගම ජිනරතන හිමි
26. පුරාවිද්‍යාඥ සුමේධා මාතොට
27. පුරාවිද්‍යාඥ දීපාල් විජේතිලක
28. පුරාවිද්‍යාඥ අජන්තා සමන් කුමාරි
29. පුරාවිද්‍යාඥ චම්පා වික්‍රමආරච්චි
30. පුරාවිද්‍යාඥ එම්.ඩී.කලණ මාරසිංහ
31. පුරාවිද්‍යාඥ එම්.එම්.එස්.ආර්.කුරේ
32. පුරාවිද්‍යාඥ ආචාර්ය ධම්මි බණ්ඩාර
33. පුරාවිද්‍යාඥ ඩබ්.ඩී.සී.සී.විජේතුංග
34. පුරාවිද්‍යාඥ පී.ඩග්ලස් බණ්ඩාර
35. පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව
36. පුරාවිද්‍යාඥ පී.වී.එන්.ප්‍රිශාන්ති
37. පුරාවිද්‍යාඥ ඩබ්.යූ.එස්.පෙරේරා

38. පුරාවිද්‍යාඥ ටී.එල්.වීරක්කොඩි

39. පුරාවිද්‍යාඥ කේ.එච්.එස්.ආර්.ප්‍රේමරත්න

40. පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

41. පුරාවිද්‍යාඥ ආචාර්ය ආර්.එච්.ඒ.එස්.ප්‍රසාද් රණසිංහ

42. පුරාවිද්‍යාඥ එස්.එස්.ජයම්පත්

43. පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්.විජේබණ්ඩාර

44. පුරාවිද්‍යාඥ ඩබ්.බී.වැපිටිය

45. පුරාවිද්‍යාඥ ඒ.කේ.රංගිකා මධුමාලි

46. පුරාවිද්‍යාඥ පී.ආර්.අසංක බුද්ධිකසිරි

47. පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි

48 පුරාවිද්‍යාඥ කේ ජී ඒ එස් සන්ධ්‍යා නවරත්න මැණිකේ

49 පුරාවිද්‍යාඥ බී එම් එස් කේ බස්නායක

50 පුරාවිද්‍යාඥ ආචාර්ය උදිතා ජිනදාස

51 පුරාවිද්‍යාඥ චමිලා විල්රුක්ෂි

52 පුරාවිද්‍යාඥ තුෂාරි වික්‍රමසිංහ

**<u>ආශ්‍රිත සාමාජික</u>**

01 පුරාවිද්‍යාඥ කේ එච් මිත්‍රානන්ද ධර්මසිරි

02 පුරාවිද්‍යාඥ ඒ බී දයාවතී

03 පුරාවිද්‍යාඥ ඩබ්ලිව් පතිරත්න

04 පුරාවිද්‍යාඥ ටී ජී එන් එස් ගමගේ

05 පුරාවිද්‍යාඥ පී උපුල් නිශාන්ත

**<u>ලිපාපදිංචි සමාජික</u>**

01 ඩබ්ලිව් එම් උපාලි සෝමසිරි

02 දාසවත්තේ පඤ්ඤාවාස හිමි

03 ඒ ඒම් ඒ දිලිනි දිල්රුක්ෂිකා

04 පී එස් කේ පෝරමගේ

05 ඒ එස් කලුආරච්චි

06 ඩයස් වගාච්චි

07 වයි ඒ ඩී ධනංජනී

**<u>ශිෂ්‍ය සාමාජික</u>**

01 කේ පී ජී එස් පී කුමාරසිංහ

02 කේ ආර් පී පිසේන

03 ජේ ඒ රශිකා නිලන්ති

04 එල් පි ඒ එච් එම් කරුණාසේන

05 එච් දිනේත්‍රා තරංගනී

06 ජී අරුණ චතුරංග බණ්ඩාර

07 ඩබ්ලිව් අබිල රණතුංග

08 ඩබ්ලිව් ඒ ඩී ජේ ජේ සී ජයසිංහ

09 ටී එම් ජී දිවංග විශ්වජිත් බණ්ඩාර

10 ඒ ඉමේෂ් කීර්තිරංග

11 එච් ආර් ටී ඩී කබරගමුව

12 එච් එල් ඩී රත්නායක

13 ආර් එම් අයි අයි සෙනෙවිරත්න

14 ජේ ඒ වී ජයසිංහ

15 ඊ ජී ටී සදමාලී ගමගේ

16 ඩබ්ලිව් එම් එස් ඩී වික්‍රමසේකර

17 ඒ එච් එස් ඒ ද සිල්වා

18 ඩබ්ලිව් ධිනූෂා කල්පනී

19 ඩබ්ල්ව් එල් පී පෙරේරා

20 එන් එච් සී කවීෂා තත්සරණී

21 ඩබ්ලිව් කිෂාන් චලීන්ද්‍ර අමරසිංහ

22 ඩබ්ලිව් සිතුමි දිල්ෂා බොතේජු

23 ඒ.ඒ.ජී.සී.එස්. අමරරත්න

24. දිලිනි ලක්මාලි මෙස්ලින්කා

25. එච්.ඒ.ආර්.එස්. රාජපක්ෂ

26. බී.ජී. සන්දීප

27. පූජ්‍ය දිවුලන්පැලැස්සේ රතනවංශ හිමි

28. ඒ.එම්.ඉමේෂ් කීර්තිරංග

29. එල්.ජී.ඒ.පාතර

30. අයි.ජී.ආර්.නිමායා විමලසූරිය

31. ඊ.ජී.අයි.එස්. සංජීව

32. ඩී.ටී.එස්.මලගල

33. එම්.සී.ඒ.සංජීව මඩපාත

34. ආර්.එම්.එම්.රණසිංහ

35. එච්.කේ.රුසිරු මෙත්මාල්

36. එම්.සී.සඳරුවන්

37. එච්.ඩී.එස්.ප්‍රනාන්දු

38. ඩී.එම්.ජේ.හන්සි ප්‍රබාෂිණි

39. ටී.දිනුෂි රුසෙරු

40. එෆ්. උමාරියා බදියුඩීන්

41. ඒ.ජේ.එම්.අයි.යූ.අබේරත්න

42. ඩී.පූර්ණ සංකල්ප පෙරේරා

43. ආර්.නිශාන්ති රණසිංහ

44. ඒ.ඩී.පී.තිමාලි

45. කේ.ඒ.එස්.යූ.කස්තුරි

46. කේ.ඒ.ඕ.ජී.කුලතුංග

47. ඩී.එස්.ඒ.මුණසිංහ

48. එන්.එන්.සඳමාලි

## 1. මහසභා රැස්වීම කැඳවීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ මහා සභාවේ කටයුතු ආරම්භ කරනු වස් ගරු සම ලේකම් පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා විසින් සභාවේ සණ පූර්ණය සපුරා ඇති බැවින් මහා සභා රැස්වීම ආරම්භ වූ බවට නිල නිවේදනය ප්‍රකාශ කරන ලදී.

අනතුරුව ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පුරාවිද්‍යාඥයන්ගේ වෘත්තීය ගරුත්වය හා එහි අභිමානය පිළිබඳ පසක් කරමින් පුරාවිද්‍යාඥ මංගලිකා වික්‍රමසිංහ මහත්මිය විසින් සභාව ආරම්භ කිරීමේ පූර්විකාව ඉදිරිපත් කරන ලදී.

## 2. සභා සම්ප්‍රාප්තිය

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ නිලධාරි මණ්ඩලය සහ ස්වර්ණ මුද්‍රිකා සම්මානලාභි පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා සහ ගරු සාමාජිකත්වලාභි මහාචාර්ය බී.ඩී. නන්දදේව මහතාණන්ගේ සභා සම්ප්‍රාප්තිය සිදුවිය.

## 3. පොල්තෙල් පහන දැල්වීම, ආගමික වතාවත් ඉටුකිරීම හා මූලාසනය පිළිගැන්වීම

සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන දැල්වීම සඳහා ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ ගරු සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත්, ගරු සම ලේකම්වරුන් වන පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා, ගරු භාණ්ඩාගාරික පුරාවිද්‍යාඥ සංඛ ගමගේ, ගරු උප භාණ්ඩාගාරික ඩබ්ලිව්. බී. වැපිටිය ස්වර්ණ මුද්‍රිකා සම්මානලාභි පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී මණ්ඩාවල, ගරු සාමාජිකත්වලාභි බී.ඩී. නන්දදේව, ආරාධිත දේශක විශ්‍රාමික මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය, පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.ආර්.එම්. චන්ද්‍රරත්න, සාමාජික අනුකමිටු සභාපති අයි.ඩී.එම්. විජේබණ්ඩාර, සාමාජික සාමාජිකත්වය වෙනුවෙන් පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක, ආශ්‍රිත සාමාජිකත්වය වෙනුවෙන් පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.

අනතුරුව සභාවේ සිට නැසීගිය පුරාවිදුවන් සිහිපත් කරනු වස් විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වන ලදී. ආගමික වතාවත් ඉටු කරමින් රැස්ව සිටි පිරිස පංචශීලයෙහි පිහිටුවීම පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමියන් විසින් ඉටුකරන ලදී. මීලඟට සභාවේ වැඩ කටයුතු නිල වශයෙන් පවත්වාගෙන යාම සඳහා පුරාවිද්‍යාඥ මංගලිකා වික්‍රමසිංහ මහත්මිය විසින් ගරු සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි මහත්මිය වෙත මූලාසනය පිළිගැන්වීම සිදුවිය.

## 4. පිළිගැනීමේ කථාව

ගරු සභාපතිතුමියගේ ආරාධනයෙන් ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත් මහත්මිය විසින් පිළිගැනීමේ කථාව සිදුකරන ලදී. එහිදී ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ වාර්ෂික මහ සභාව සඳහා සහභාගිවීම ට සියළුම සංස්ථාගත සංස්ථාගත නොවන සාමාජික සාමාජිකාවන්ට ආරාධනා කළ අතර, ඒ අනුව වැඩමවා වදාළ ගරුතර මහා සංඝරත්නය, පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක මණ්ඩලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, සියලු ම විශ්වවිද්‍යාල සහ අනිකුත් පුරාවිද්‍යා ආයතන නියෝජනය කරමින් පැමිණි සියලුම දෙනා පිළිගන්නා බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මෙදින ස්වර්ණ මුද්‍රිකා සම්මානලාභි මහාචාර්ය පී.බී මණ්ඩාවල, ගරු සාමාජිකත්වලාභි මහාචාර්ය බී.ඩී නන්දදේව යන මහත්වරුන් සේම, ආරාධිත විශේෂ දේශක විශ්‍රාමික මැතිවරණ කොමසාරිස් වත්මන් සීමා නිර්ණ කොමිෂන් සභාවේ ගරු සභාපති මහින්ද දේශප්‍රිය මහතාණන් ද විශේෂ වශයෙන් පිළිගන්නා ලදී.

## 5. ස්වර්ණ මුද්‍රිකාව පිරිනැමීම හා ගරු සාමාජිකත්වය පිරිනැමීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව වෙනුවෙන් කරන ලද මෙහෙය අගයනු වස් ස්වර්ණ මුද්‍රිකා සම්මානය පිරිනැමීම මීළගට සිදුවිය. එහි හේතුපාඨය කියවීම පුරාවිද්‍යාඥ මහාචාර්ය අලෙක්සැන්ඩර් කපුකොටුව මහතා විසින් ඉටුකරන ලද අතර, සම්මානලාභි පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා වේදිකාව වෙත කැඳවාගෙන ඒම පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත මහතා විසින් සිදුකරන ලදී. අනතුරුව ගරු සභාපතිතුමිය විසින් පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා වෙත ස්වර්ණ මුද්‍රිකා සම්මාන ප්‍රදානය කරන ලදී.

එමෙන්ම පුරාවිද්‍යා විෂයීය වශයෙන් පුරාවිද්‍යා ක්ෂේත්‍රයට කරන ලද මෙහෙය අළලා වසරකට එක් වරක් පමණක් පිරිනැමෙන පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ ගරු සාමාජිකත්වය පිරිනැමීම මීළගට සිදුවිය. ඒ සඳහා හේතුපාඨය කියවීම පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය විසින් ඉටුකරන ලද අතර, ගරු සාමාජිකලාභි මහාචාර්ය බී.ඩී නන්දදේව මහතා වේදිකාව වෙත කැඳවාගෙන ඒම පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක මහතා විසින් සිදුකරන ලදී. අනතුරුව ගරු සභාපතිතුමිය විසින් මහාචාර්ය බී.ඩී නන්දදේවයන් වෙත ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ ගරු සමාජිකත්වය පිරිනමන ලදි.

## 6. ආරාධිත දේශනය

ආරාධිත දේශක හඳුන්වාදීමේ කාර්යභාරය ගරු සභාපතිතුමිය විසින් සිදුකළ අතර, ඒ සඳහා පාත්‍ර වූයේ ''සමකාලීන සමාජ අර්බුධය හමුවේ වෘත්තිකයන්ගේ කාර්භාරය'' යන මැයෙන් වූ දේශනය පැවැත් වූ විශ්‍රාමික මැතිවරණ කොමසාරිස් වත්මන් සීමානිර්ණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාණන් ය. තම දේශනය තුළ සමාජ අර්බුධය ආර්ථිකමය වශයෙන් හා දේශපාලනිකමය වශයෙන් ගැට ගැසී ඇති අයුරු හා ආරෝපිත නිදහස තුළ රාජ්‍ය සේවකයා ක්‍රියාකළ යුතු අන්දම නිදසුන් සහිතව ගෙනහැර පාමින් කථා කළහ.

තවද අන්‍ය මත සඳහා ඉඩ තැබීම, පොදු වැඩ සාමුහිකත්වයෙන් යුතුව ඉටුකිරීම මෙන්ම, වෘත්තිකයන් යනු විෂයක් පිළිබඳ ප්‍රවීණයන් සේම, පුරවැසියන් හට මගපෙන්වීම ඔවුනගේ කාර්යභාරය වන බවද, තම විෂය ධාරාව වන දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටීම බවද අවධාරණය කරමින් මේ සඳහා ආරාධනා කළ පුරාවිදුවන්ගේ සභාවට ස්තුතිය පුද කරමින් සිය දේශනය හමාර කළේය. දේශක සඳහා තිළිණ ප්‍රදානය ගරු සභාපතිතුමිය විසින් ඉටුකරන ලදී.

## 7. පසුගිය වසරේ මහාසභා වාර්තාව ඉදිරිපත් කිරීම හා සභා සම්මත කර ගැනීම

පසුගිය වර්ෂයේ මහා සභා වාර්තාව ගරු සම ලේකම් පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලදුව, එහි සංශෝධන නොවුයෙන් පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල සහ පුරාවිද්‍යාඥ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි යන මහත්වරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## 8. 2022-2023 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සහ සභා සම්මත කර ගැනීම

2022-2023 වාර්ෂික වාර්තාව ගරු සම ලේකම් පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මහත්මිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදි කුරුන්දි විහාරයේ පිහිටීම වව්නියාව යනුවෙන් සඳහන්වීම දෝෂ සහිත වන අතර එය මුලතිව්

ලෙස නිවැරැදි විය යුතු බවත්, එලෙස සංශෝධනයට යටත්ව සත්‍ය වාර්තාවක් ලෙස පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක මහතා විසින් යෝජනා කරන ලදුව පුරාවිද්‍යාඥ කළණ මාරසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.

## 9. 2022-2023 වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම සහ සභා සම්මත කර ගැනීම

පසුගිය වර්ෂයේ මූල්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම ගරු භාණ්ඩාගාරික පුරාවිද්‍යාඥ ටී.ජී.එස්. ගමගේ මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ දත්තයන් අතර සටහන් වීමේ හා කියවීමේ වෙනස්කම් පිළිබඳව ගැටළුවක් පවතින බව ප්‍රකාශ කළෙන්, එහි නිවැරදිතාව පිළිබඳ ගරු සභාපතිතුමිය හා ගරු භාණ්ඩාගාරිකතුමා විසින් කරුණු ගෙනහැර පෑහ. එමෙන්ම පොළී අනුපාතයන් පිළිබඳව සටහන් කිරීමේ දී ජංගම ගිණුමක පොළිය නොව ස්ථාවර ගිණුමක ශේෂය ලෙස නිවැරදි විය යුතු යැයි පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා අදහස් ඉදිරිපත් කරන ලදී. අනතුරුව සංශෝධනයට යටත්ව වාර්තාව පුරාවිද්‍යාඥ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි පුරාවිද්‍යාඥ ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ යන මහත්වරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## 10. හැඳුනුම්පත් ප්‍රදානය

සභාවේ සාමාජික සමාජිකාවන්ට නිල වශයෙන් හැඳුනුම්පත් පිරිනැමීම මීළගට සිදුවිය. එහිදි ගරු සභාපතිතුමියගේ ආරාධනයෙන් එකී කමිටු සාමාජික පුරාවිද්‍යාඥ කළණ මාරසිංහ මහතා විසින් මෙහි පසුබිම පිළිබඳ සවිස්තරාත්මක කරුණු පැහැදිළි කිරීමක් කරනු ලැබ, සංකේතාත්මක ව හැඳුනුම්පත් කීපයක් ද ප්‍රදානය කරන ලදී. මේ සඳහා ගරු සභාපතිතුමිය සහභාගි වූ අතර පුරාවිද්‍යාඥ අසංක බුද්ධිකසිරි පුරාවිද්‍යාඥ රංගිකා මදුමාධවී යන කමිටු සාමාජිකයන්ගේ දායකත්වය ද ඒ සඳහා ලැබුණි.

## 11. යෝජනා හා සාකච්ඡා වාරය

මහා සභාව වෙත ලිපි 04 ක් ලැබී තිබූ බව ගරු සභාපතිතුමිය ප්‍රකාශයට පත්කරන ලදුව, යෝජනා හා සාකච්ඡා වාරය ගරු සභාපතිතුමිය විසින් මෙහෙය වනු ලැබීය. ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ වාර්ෂික මහා සභාව පැවැත්වෙන බව නිල වශයෙන් සාමාජිකයනට දැනුම් දීමේ දී වාර්ෂික තැපැල් ගාස්තු වශයෙන් විශාල මුදලක් වැය වන බැවින් මින් ඉදිරියට තාක්ෂණය උපයෝගි කරගෙන එකී කාර්යය ඉටුකිරීම සුදුසු බව පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර යෝජනා කර තිබිණි. මේ පිළිබඳව පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.ආර්.එම්. චන්ද්‍රරත්න පුරාවිද්‍යාඥ මහාචාර්ය ඇලෙක්සැන්ඩර් කපුකොටුව පුරාවිද්‍යාඥ මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි යන මහත්වරුන් අදහස් දැක් වූ අතර, සභාවේ නිල වෙබ් අඩවිය, මුහුණු පොත, ඊ-තැපැල සහ වට්ස් ඇප් මගින් දැනුවත් කිරීම සුදුසු බව මහාචාර්ය පී.බී. මණ්ඩාවල පුරාවිද්‍යාඥ මහාචාර්ය ඇලෙක්සැන්ඩර් කපුකොටුව යන මහත්වරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ කාන්තා පුරාවිද්‍යාඥවරියන්ගේ කාර්යභාරය පිළිබඳව තමා පර්යේෂණයක නියැලි සිටින බැවින් ඒ සඳහා ඇවැසි දත්ත ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමක් කෝෂලී කැකුලන්දල මහත්මිය විසින් සිදුකර තිබිණි. ඒ අනුව එහි පසුබිම, අවශ්‍ය විස්තර පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හා එවැනි ලේඛනයක් මෙතෙක් සකස්කර නොමැතිවීමත් එසේ ඇතැම් සාමාජික තොරතුරු ලබා දීමේදී මතු වන නෛතික හා සදාචාරාත්මක කරුණු පැවතීමත් ඊට හේතු වූ බවත් ඉදිරියේ දී සාකච්ඡා කර තීරණයක් ගත යුතු බව ගරු සභාපතිතුමිය විසින් සභාවට දැන්වූවාය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොත් අළෙවි සැල තුළ තබා සාමාජිකයන්ගේ ප්‍රකාශන අලෙවි කර ගැනීමට අවස්ථාවක් සලසා දෙන ලෙස පුරාවිද්‍යාඥ මනුර ජයසුන්දර මහතා ඉල්ලීමක් කර තිබිණි. ඒ අනුව පුරාවිද්‍යා

අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලබාගෙන අදාල ප්‍රකාශන අලෙවි කර ගැනීමට කටයුතු සලසා ගත යුතු බවට අදහස් ඉදිරිපත් කෙරිණ.

පුරාවිද්‍යාඥයන් සඳහා වූ යෝජිත සේවා ව්‍යවස්ථාව පිළිබඳව කේ.ඊ. ධර්මපාල මහතා යෝජනාවක් ඉදිරපත් කර තිබූ අතර, ඒ පිළිබඳව මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි කිරීමක් ගරු සභාපතිතුමිය විසින් සිදු කළාය.

පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ අධි සාමාජිකත්වයට ඉල්ලුම් කිරීමේ දි දැනට පනවා ඇති බාධා ඉවත් කරන ලෙස පුරාවිද්‍යාඥ අනුෂි තිසාරා කාරියවසම් මහත්මිය යෝජනා කර තිබිණි. මේ පිළිබඳව සභාව දීර්ඝ වශයෙන් සාකාච්ඡා කළ අතර සභාව මෙතෙක් අනුගමනය කළ ප්‍රතිපත්තිය වූයේ සභාවේ ගැසට් පත්‍රයට අනුකූලව බවත්, වෘත්තිකයන්ගේ අභිමානය සුරැකෙන අයුරින් එහි සංශෝධනය සිදු විය යුතු බවත් ගරු සභාපතිතුමිය අවධාරණය කළාය. සභාවේ සාමාජිකයන් මත පිහිටා, තිබෙන බාධා ලිහිල් කර නව නිර්ණායකයන් අනුව කටයුතු කිරීම සුදුසු බවට ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

අධි සාමාජික අයදුම්පත සංශෝධනය කළ යුතු බවත් අධි සාමාජික ඇගයීමේ කාල සීමාව වසර 7 දක්වා අඩු කිරීමට සළකා බලන්නේ නම් මැනවයි පුරාවිද්‍යාඥ කළණ මාරසිංහ මහතා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී. තව දුරටත් මෙකී යෝජනාවන් පිළිබඳව පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල, පුරාවිද්‍යාඥ මහාචාර්ය ඇලෙක්සැන්ඩර් කපුකොටුව මහතා, පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි පුරාවිද්‍යාඥ සමන්ති ප්‍රියංගා, පුරාවිද්‍යාඥ තරංගි වීරක්කොඩි යන මහත්ම මහත්මීන් අදහස් ඉදිරිපත් කළහ. අවසන දැනට මෙහි පවත්නා නිර්ණායකයන් සංශෝධනය කිරීම පිළිබඳව කමිටුවක් පත්කර එහි නිර්දේශ මත ක්‍රියාකළ යුතු බවට යෝජනා කෙරිණ. එම කමිටුව පහත අයවලුන්ගෙන් සමන්විතය.

| | |
|---|---|
| 01. පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී මණ්ඩාවල මහතා | - සභාපති |
| 02. පුරාවිද්‍යාඥ මහාචාර්ය ඇලෙක්සැන්ඩර් කපුකොටුව මහතා | - ලේකම් |
| 03. පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත් මිය | - සභාපති (පු.වි. සභාවේ ) |
| 04. පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මිය | - සම ලේකම් |
| 05. පුරාවිද්‍යාඥ අයි.ඩී එම්. විජෙබණ්ඩාර මහතා | - සම ලේකම් |
| 06. පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක මහතා | - පු.වි.දෙ. නියෝජනය |
| 07. පුරාවිද්‍යාඥ පාලිත අත්තනායක මහතා | - පු.වි.දෙ. නියෝජනය |
| 08. පුරාවිද්‍යාඥ ආචාර්ය ප්‍රසාද් රණසිංහ මහතා | - ම.ස.අ. නියෝජනය |
| 09. පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මිය | - ම.ස.අ. නියෝජනය |
| 10. පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.ආර්.රම්. චන්ද්‍රරත්න මහතා | - කමිටු සාමාජික |
| 11. පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව මහතා | - විශ්වවිද්‍යාල නියෝජනය |
| 11. පුරාවිද්‍යාඥ අනුෂි තිසාරා කාරියවසම් මිය | - කමිටු සාමාජික |

## 12. 2023 / 2024 වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩල පත් කර ගැනීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 2023 - 2024 වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩලයක් පත්කර ගැනීම සම්බන්ධයෙන් ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත් මිය විසින් සභාවට කරුණු ඉදිරිපත් කළා ය. ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව පනත ප්‍රකාරව 2023 - 2024 වර්ෂ සඳහා පුරප්පාඩු වන නිලධාරි හා කාරක සභික තනතුරු සඳහා නාම යෝජනා ඉදිරිපත්ව තිබූ අතර ඒ අතරින් නිලධාරීන් 08 දෙනෙක්

හා කාරක සභිකවරු 11 දෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලය සමන්විත විය යුතු බව සභාවට දැන්වූවා ය. ගරු ජ්‍යෝෂ්ඨ උප සභාපති නිල බලයෙන් මිළග ගරු සභාපති වන අතර, ගරු ජ්‍යෝෂ්ඨ උප සභාපති , ගරු උප සභාපති, ගරු භාණ්ඩාගාරික, ගරු උප භාණ්ඩාගාරික තනතුරු පුරප්පාඩු වන අතර ගරු සම ලේකම් තනතුරක් දැරිය හැක්කේ අඛණ්ඩව වසර 02 ක් පමණක් වන බැවින් එකී කාලය ඉකුත්වීම කරන කොටගෙන සම ලේකම් තනතුරක් හා කාරක සභිකවරු 11 දෙනෙකු මිළග පාලක මණ්ඩලයට පත්කර ගත යුතු බව සභාවට දැන්වූවාය. මෙහිදි ඉදිරිපත්ව තිබූ නාම යෝජනා අනුව නිතරගයෙන් හා පැවැති ඡන්ද ප්‍රතිඵල අනුව ද පාලක සභාව වෙත පහත සභිකයන් පත්විය.

**ගරු ජ්‍යෝෂ්ඨ උප සභාපති**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීරිම |
|---|---|---|---|
| 01 | ආචාර්ය බී.එම්.ඩබ්. බෝහිංගමුව | පුරාවිද්‍යාඥ ඩී.එම්.එස්.ආර්. ප්‍රියංගා | පුරාවිද්‍යාඥ වාසනා ප්‍රේමචන්ද්‍ර |

**ගරු උප සභාපති**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීරිම |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යාඥ මහාචර්ය පී.බී මණ්ඩාවල | පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි | පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත් |

**ගරු සම ලේකම්**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීම |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර | පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්. බෝහිංගමුව | පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක |

වෙනත් යෝජනා නොතිබූ හෙයින් ඉහත තනතුරු සඳහා නිතරගයෙන් පත්විය.

**ගරු භාණ්ඩාගරික**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීරිම |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යාඥ ඩබ්. බී. වැපිටිය | පුරාවිද්‍යාඥ රේෂානි ධර්මවර්ධන | පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ |

**ගරු උප භාණ්ඩාගාරික**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීරිම |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව | පුරාවිද්‍යාඥ ඩී.එම්.ආර්.ඒ.බණ්ඩාර | පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි |

කාරක සභික, අධි සාමාජික, සාමාජික ,

මෙහිදි කාරක සභාව සඳහා සංස්ථාගත සභිකයන් 8 දෙනෙකු පත්කර ගත යුතුව තිබූ අතර සංස්ථාගත කාණ්ඩයට ඉදිරිපත්ව තිබූ යෝජනා ප්‍රමාණය ඉක්මවා ගොස් තිබූ බැවින් ඡන්දයක් මඟින් සභිකයන් තෝරා පත්කර ගැනීමට කටයුතු කෙරිණි.

ඒ අනුව පැවැත්වූ ඡන්දයෙන් වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් පහත සභිකයින් තේරී පත් විය.

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීම |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.ආර්.එම්. චන්ද්‍රරත්න | පුරාවිද්‍යාඥ ආචාර්ය උදිතා ජිනදාස (සාමාජික) | පුරාවිද්‍යාඥ පියුමි මධුෂානි ඇඹුල්දෙණිය (සාමාජික) |
| 02 | පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි | පුරාවිද්‍යාඥ ආචාර්ය ඩබ්.බෝහිංගමුව (අධි සාමාජික) | පුරාවිද්‍යාඥ ඩබ්.වීරරත්න (ආශ්‍රිත සාමාජික) |
| 03 | පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි | පුරාවිද්‍යාඥ වී.එන්.කන්නන්ගර (සාමාජික) | පුරාවිද්‍යාඥ ඉමල්කා දනන්සූරිය (සාමාජික) |
| 04 | පුරාවිද්‍යාඥඅනුරුද්ධ වන්නිනායක | පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර (සාමාජික) | පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා (සාමාජික) |
| 05 | පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ | පුරාවිද්‍යාඥ පී.ආර්. අසංක බුද්ධිකසිරි (සාමාජික) | පුරාවිද්‍යාඥ රේෂාණි ධර්මවර්ධන (සාමාජික) |
| 06 | පුරාවිද්‍යාඥ අසංක බුද්ධිකසිරි | පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ (සාමාජික) | පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා (සාමාජික) |

**කාරක සභික - සහය සාමාජික**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීම |
|---|---|---|---|
| 01 | පු.වි. උපුල් නිශාන්ත | පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක (සාමාජික) | පුරාවිද්‍යාඥ තුෂාරි වික්‍රමසිංහ |
| 02 | පු.වි. ඩබ්. එස්. වීරරත්න | පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි (අධි සාමාජික) | පී.ජී.එස්.ඒ.ගමගේ (ආශ්‍රිත සාමාජික |

**කාරක සභික - ලියාපදිංචි සාමාජික**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීම |
|---|---|---|---|
| 01 | ප්‍රබුද්ධිකා හේන්දාවිතාරණ | සිතුම් බොතේජු | කවීෂා නානායක්කාර |

**කාරක සභික - ශිෂ්‍ය සාමාජික**

| අංක | නාම යෝජනා | යෝජනා කිරීම | ස්ථිර කිරීම |
|---|---|---|---|
| 01 | ෂෙහාන් තිලකරත්න | ඩී.එස්.ඒ මාරසිංහ | ශානිකා කුමාරසිංහ |
| 02 | ඔදේෂිකා කුලතුංග | සමීර ප්‍රසංග | තිනේෂා කරුණාරත්න |

**2023 - 2024 වර්ෂය සඳහා තේරී පත් වූ පාලක මණ්ඩලය**

01. ගරු සභාපති - පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත්

02. ගරු ආසන්නතම පූර්ව සභාපති - පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංආරච්චි

03. ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති - ආචාර් පුරාවිද්‍යාඥ විජේරත්න බෝහිංගමුව

04. ගරු උප සභාපති - පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල

05. ගරු සම ලේකම් - පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

06. ගරු සම ලේකම් - පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර

07. ගරු භාණ්ඩාගාරික - පුරාවිද්‍යාඥ ඩබ්.බී. වැපිටිය

08. ගරු උප භාණ්ඩාගාරික - පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව

09. පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.ආර්.එම්. චන්ද්‍රරත්න - කාරක සභික අධි සාමාජික

10. පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි - කාරක සභික අධි සාමාජික

11. පුරාවිද්‍යාඥ පූජ්‍ය කන්තලේ සුමිත්ත - කාරක සභික සාමාජික

12. පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිකායක - කාරක සභික සාමාජික

13. පුරාවිද්‍යාඥ කලණ මාරසිංහ - කාරක සභික සාමාජික

14. පුරාවිද්‍යාඥ අසංක බුද්ධිකසිරි - කාරක සභික සාමාජික

15. පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත - කාරක සභික සහය සාමාජික

16. පුරාවිද්‍යාඥ ඩබ්.එස්.වීරරත්න - කාරක සභික සහය සාමාජික

17. ප්‍රබුදධිකා හේන්දාවිතාරණ - කාරක සභික ලියාපදිචි සාමාජික

18. ෂෙහාන් තිලකරත්න - කාරක සභික ශිෂ්‍ය සාමාජික

19. ඔදේශිකා කුලතුංග - කාරක සභික ශිෂ්‍ය සාමාජික

## 13. නව සාමාජිකයන් සඳහා සහතික පත්‍ර ප්‍රදානය

ගරු සභාපතිතුමියගේ ආරාධනයෙන් සාමාජික අනු කමිටු සභාපති පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර මහතා විසින් නව සහතික පත්‍ර ප්‍රදානය පිළිබඳ අදහස් දැක්වූ අතර එහිදි අධි සාමාජිකයන් දෙදෙනෙකු සාමාජික කාණ්ඩයේ සාමාජිකයන් හත් දෙනෙකු ආශ්‍රිත සාමාජික එක් අයෙකු ලියාපදිංචි සාමාජිකයින් තිදෙනෙකු සහ ශිෂ්‍ය සාමාජිකයින් හැත්තෑ තුන් දෙනෙකු වශයෙන් අසූ හය දෙනෙකු උදෙසා සහතික පත්‍ර ප්‍රදානය සිදු කළහ. සහතික පත්‍ර ප්‍රදානය සඳහා ගරු සභාපති - පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංආරච්චි ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති මහාචාර්ය යමුනා හේරත් මහත්මිය ගරු සම ලේකම් පුරාවිද්‍යාඥ ආචර්ය විජේරත්න බෝහිංගමුව පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහාචාර්ය ගාමිණි අධිකාරි මහාචාර්ය ආර්.ආර්. එම්. චන්ද්‍රරත්න යන මහත්ම මහත්මීන් සහභාගි වු අතර මංගලිකා වික්‍රමසිංහ, ප්‍රබුද්ධිකා හෙන්දාවිතාරණ අසංක බුද්ධිකසිරි , රංගිකා මධුමාදවි යන අයවලුන් සහය වූහ.

### 14. නව නිලධාරි මණ්ඩලය කටයුතු ඇරඹීම

මෙහිදි නව සභාපති පුරාවිද්‍යාඥ මහාචාර්ය යමුනා හේරත් මහත්මිය සභාව අමතමින් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම උදෙසා ඔබ සැමගේ යෝජනා හා අදහස් ඉතා වැදගත් වන බවද ජ්‍යෙෂ්ඨ

පුරාවිද්‍යාඥයන් සමග තරුණ පරම්පරාව ද ඉදිරියට යා යුතු බවත් අවධාරණය කරමින් සිය මුලසුනේ දෙසුම පැවැත්වීය.

15. ගරු ආසන්න පූර්ව සභාපති පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි මහත්මිය සභාව අමතමින් තමා මෙම සභාවේ 12 වන සභාපතිවරිය වශයෙන් පත්ව, පුරාවිද්‍යා වෘත්තිකයන් වෙනුවෙන් කාර්යභාරයන් රැසක් ඉටුකිරීමට දායක වූ බව සඳහන් කරමින් නව ගැසට් පත්‍ර මුද්‍රණය, පුරාවිද්‍යාඥයන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය එළිදැක්වීම, පුරාවිද්‍යාඥයන්ගේ කටයුතු කරගෙන යාම සඳහා නව කාර්යාලයක් ලබා ගැනීමට කටයුතු කිරීම, වැනි කාර්යන් සිය ධුරකාලය තුළ අවසන් කිරීමට හැකි වූ බවත් පනත සංශෝධනය, සේවා ව්‍යවස්ථාව සැකසීම සහ අනෙකුත් කටයුතු කීපයක් ප්‍රවර්ධනාත්මක ප්‍රවේශයකට එළඹීමට හැකි වූ බව ද අවධාරණය කරමින් සිය ධුර අවසන් කථාව සිදුකළ අතර, පාලක සභාවේ සියලු දෙනා ඇතුළු සභාවේ සැමට සිය කෘතඥතාව පුදකළාය. අවසාන වශයෙන් නැසීගිය පූජ්‍ය පත්බේරියේ ඥානාලෝක හිමියන්ටත් ආචාර්ය ශිරාන් දැරණියගලයන්ටත් සිය කෘතවේදිත්වය පුද කරමින් සිය කතාව අවසන් කළාය.

## 15 ස්තුති කථාව

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ ආසන්න හිටපු සම ලේකම් පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව සිය ස්තුති කථාව පවත්වමින් සභාවේ ඉදිරි පැවැත්ම වෙනුවෙන්  හැකි උපරිම අයුරින් මැදිහත්වීමට කටයුතු කළ බවත්, එහිදි ඇතැම් කටයුතු සැළසුම් කළ පරිදි ඉටුකර ගත නොහැකි වූ බවත්, ඒ සඳහා ගෙවුණු දුෂ්කර කාලසමය ඉවහල් වූ බවත්, සඳහන් කරමින් සිය ස්තුති කථාව පවත්වන ලදී. තවද අවසන් කරගත නුහුණු කටයුතු ඉදිරියට කරගෙන යාමට සැමගේ සහයෝගය අපේක්ෂා කරන බවත්, පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ කටයුතු කරගෙන යාමට සහයෝගය දැක් වූ ගරු සභාපතිතුමිය ප්‍රමුඛ පාලක මණ්ඩලයටත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඇතුලු සියලු විශ්වවිද්‍යාල සාමාජික සාමාජිකාවන්ටත්, විශේෂයෙන් ආරාධිත දේශනය පැවැත් වූ හිටපු මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාටත්, ස්වර්ණ මුද්‍රිකා සම්මානලාභි පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතාටත්, ගරු සාමාජිකත්වලාභි මහාචාර්ය බී.ඩී. නන්දදේව මහතාටත් සිය කෘතවේදිත්වය පුදකළ අතර, අවසාන වශයෙන් මහා සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාමට නන් අයුරින් සහයෝගය දැක් වූ සැමට සිය ස්තුතිය පුද කරමින් කථාව අවසන් කළේය.

## 16. ජාතික ගීය වාදනය සහ සභාවේ කටයුතු නිමාව

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ මහා සභාව සඳහා සහභාගි වූ සැමට දිවා ආහාරය සුදහා ඇරයුම් කරමින් ජාතික ගීය වාදනය කිරීමත් සමග ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ මහා සභාවේ 29 වන මහා සභා වාරය අවසන් කරමින් සභා තොමෝ සතුටින් විසිර ගියහ.



පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා
සම ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව



පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර
සම ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව